## හැඳින්වීම

අන්තකර්රණ අධ්‍යාපනය යනු සියලු ම දරුවන්ට සමාන ඉගෙනුම් අවස්ථා ලබා දීමට සහ ඔවුන්ගේ දියුණු වීම සඳහා අවශ්‍ය නිපුණතා වර්ධනය කර ගැනීමට සහ විවිධත්වය වැළඳ ගැනීමට උපකාර වන ඵලදායී ක්‍රමයකි. අන්තකර්රණ අධ්‍යාපනය ක්‍රියාවට නැංවීම අපහසු නොවන අතර, විශාල මුදලක් වැය නොකර, දරුවන්ගේ විශේෂ අවශ්‍යතා සපුරාලීමෙන් සහ දෙමාපියන්ගේ/භාරකාරයන්ගේ සහය ඇතිව පාසල් යටිතල පහසුකම් ක්‍රමානුකූල ව වැඩිදියුණු කිරීමෙන් වඩාත් අන්තකර්රණ පාසල් නිමර්ාණය කළ හැකිය.

අධ්‍යාපන අමාත්‍යාංශය, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) සමඟ එක්ව 2019 සිට 2024 දක්වා ශ්‍රී ලංකාවේ පිළියන්දල,කුරුණෑගල හා නිකවැරටිය අධ්‍යාපන කලාප වලින් තෝරාගත් පාසල් 4 බැගින්, පාසල් 12ක් ඇසුරින් අන්තකර්රණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත. මෙම ව්‍යාපෘතිය මගින් ගුරුවරුන්, අන්තකර්රණ අධ්‍යාපන සම්බන්ධීකාරකවරුන්, විදුහල්පතිවරුන් සහ දෙමාපියන්/ භාරකරුවන් විසින් බොහෝ යහපත් භාවිතයන් නිමර්ාණය කර ඇත. මෙම පොත් පිංචේ ඇතුළත් ලිපි සම්පාදනය කර ඇත්තේ ව්‍යාපෘති කාලසීමාව තුළ, පාසල් වෙනස් වී ඇති ආකාරය නිරීක්ෂණය කිරීම සඳහා පාසල්වලට ගොස් එයට සම්බන්ධ පුද්ගලයින් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීමෙනි. මෙම ලිපිවල අඩංගු වන්නේ සත්‍ය කථා වන අතර පාසල් වඩාත් අන්තකර්රණ හිතවාදී වීමට අවශ්‍ය ඉඟි වලින් පිරී ඇත.

ඔබේ පාසල ද එක් පියවරක් ඉදිරියට තබා ඔවුන් හා එක්වනු ඇතැයි අපි ඉත සිතින් බලාපොරොත්තු වෙමු.